www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාව: මහ බැංකු සේවක සංගමය සසපට එරෙහි තර්ජනය ඉවත් කර ගන්නා ලෙස ඉල්ලා සිටී

## Sri Lanka: Central Bank union demands retraction of threats against SEP

**අපගේ වාර්තාකරුවන් විසිනි**
**2007 නොවැම්බර් 29**

ශ්‍රී ලංකාවේ මහ බැංකු සේවක සංගමයේ (මබැසේස) විධායක කමිටුව නොවැම්බර් 12 දා යෝජනාවක් සම්මත කරමින්, මබැසේස සභාපති කේ.බී. මාවිකුඹුරට හා භාණ්ඩාගාරික එම්.ඩබ්ලිව්. පියරත්නට එරෙහි ශ්‍රී ලංකා මහ බැංකු සේවක සංගමයේ (ශ්‍රීලමබැසේස) තර්ජනය ඉවත් කර ගන්නා ලෙස ශ්‍රීලමබැසේස නායකත්වයෙන් ඉල්ලා සිටියේ ය. මාවිකුඹුර සමාජවාදී සමානතා පක්ෂයේ (සසප) දිගු කාලීන සාමාජිකයකු වන අතර පියරත්න සසපයේ සමීප ආධාරකරුවෙකි.

සැප්තැම්බර් මස පැවති මබැසේස වාර්ෂික මහා සභා රැස්වීම ආන්ඩුව යලි සිවිල් යුද්ධය ඇවිලවීමට විරුද්ධ යෝජනාවක් සම්මත කිරීමෙන් පසුව ජනතා විමුක්ති පෙරමුනට (ජවිපෙ) අනුබද්ධිත ශ්‍රීලමබැසේස නිකුත් කල පත්‍රිකාවක්, දිවයිනේ උතුරෙන් හා නැගෙනහිරෙන් හමුදා ඉවත් කරන ලෙස ඉල්ලා සිටීම හෙලා දැක මාවිකුඹුර හා පියරත්න "සිංහල කොටි" ලෙස හංවඩු ගැසී ය. යුද්ධයේ සිංහල ස්වෝත්තමවාදී ආධාරකරුවන්ගේ භාෂාවෙන් ගත් කල, "සිංහල කොටි" ලේබලය, එනම්. බෙදුම්වාදී දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයේ ආධාරකරුවන් ය යන්න, "ද්‍රෝහියා" යන්නට සමාන වේ.

ජවිපෙ යලි ඇරඹූ යුද්ධයට මුලුමනින් ම සහාය දෙයි. ජනාධිපති මහින්ද රාජපක්ෂ සම්බන්ධයෙන් ජවිපෙට පවතින විවේචනය නම්, ඔහුගේ ආන්ඩුව එල්ටීටීඊයට විරුද්ධව විවෘතව යුද ප්‍රකාශ කොට, ඊනියා ජාත්‍යන්තර සාම ක්‍රියාදාමය පසෙක දමා එල්ටීටීඊය මිලිටරිමය ලෙස තලා දැමීම පිනිස පියවර ගැනීමට අසමත්ව ඇත යන්න ය. වෘත්තීය සමිති තුල සිටින ජවිපෙ ආධාරකරුවෝ. කම්කරුවන්ගේ අයිතීන්ගේ හා කොන්දේසිවල ආරක්ෂකයන් ලෙස පෙනී සිටින ගමන් ම, යුද ප්‍රයත්නය සඳහා කැප කරන ලෙස ඉල්ලා සිටින අතර වර්ගවාදී යුද්ධයේ විරුද්ධවාදීන් දඩයම් කිරීමට උත්සාහ කොට ඇත.

මබැසේස විධායක කමිටුව, මාවිකුඹුර දිගු කාලීන සසප සාමාජිකයකු ලෙස "එල්ටීටීඊයේ බෙදුම්වාදයටත් ජවිපෙ ස්වෝත්තමවාදයටත් මූලධර්මාත්වකව විරුද්ධ බව ද සුප්‍රකට කරුනකි" යන්න පෙන්වා දෙමින්, ඔහු "සිංහල කොටියෙකි" ය යන අවලාදය ප්‍රතික්ෂේප කලේ ය. මාවිකුඹුර හා පියරත්න "සිංහල කොටි" ලෙස ප්‍රකාශ කිරීම ශාරීරික ප්‍රචන්ඩත්වයක තර්ජනය මතු කරන බවට යෝජනාව අනතුරු ඇඟවී ය. "පැහැර ගැනීම්, අතුරුදහන් කිරීම් සිදු කරන ඝාතක කන්ඩායම් නිදැල්ලේ රට තුල සැරිසරති. දිවයින පුරා ම චෝදනා රහිතව පුද්ගලයන් රඳවා ගැනීමට භාජන කෙරෙයි." යැයි එය සඳහන් කලේ ය.

"ශ්‍රීලමබැසේසයෙන් එල්ල වන තර්ජනය සාමාන්‍ය දෙයක් නොවේ. 1988-1989 භීෂන සමයේ ජවිපෙ ඝාතක කල්ලි මුදා හැරි අතර එහි වර්ගවාදී විරෝධතාවලට සහභාගි නොවූ හා විරුද්ධ වූ දේශපාලන විරුද්ධවාදීන්, වෘත්තීය සමිති සාංගමිකයන්, කම්කරුවන් හා තරුනයන් සිය ගනනක් මරා දැමුනි. ඔවුනතර විකොඃස සාමාජිකයන් තිදෙනෙක් ද විය. 1988 දෙසැම්බර් 26 දින මාවිකුඹුර සොයා ගැනීමට තුවක්කුකරුවන් කන්ඩායමක් යැවුනේ එම ඉරනමට ම ගොදුරු කිරීමට ය. මැර කන්ඩායමක් ඔහුගේ නිවස තනන තැනට යැවූ මුත් ඔහු සොයා ගැනීමට නොහැකි විය." යැයි එම යෝජනාව තව දුරටත් කියා සිටියේ ය.

යෝජනාව සඳහන් කල පරිදි, මබැසේස පලමු යෝජනාවට ශ්‍රීලමබැසේස දැක්වූ සැබෑ විරුද්ධත්වය එල්ල වූයේ. "එහි අඩංගු සත්‍ය කරුනට ය. එනම් යුද්ධයට විරුද්ධ නොවී වැඩ කරන ජනතාවට තමන්ගේ අවම ජීවන තත්වයන් හා අනෙකුත් අයිතීන් ආරක්ෂා කර ගත නොහැකිය යන කරුනට ය. ශ්‍රීලමබැසේස සහ ජවිපෙ යුද්ධයට මුලුමනින් ම සහාය දෙමින් ඊට කැපකිරීම් කරන ලෙස කම්කරුවන්ගෙන් ඉල්ලති." හමුදා ඉවත් කරන ලෙස කරන ඉල්ලීම එල්ටීටීඊයට සහාය දීමක් බවට ශ්‍රීලමබැසේස කරන චෝදනාව බොරුවක් බව එම යෝජනාව පැහැදිලි කරයි. "ඊට පටහැනිව, මෙම කැඳවුම වනාහි ආන්ඩුවට ද එල්ටීටීඊයට ද එරෙහිව සිංහල-දෙමල වැඩ කරන ජනතාව සමාජවාදී පිලිවෙත් මත එකමුතු කිරීමේ කැඳවුමකි." යැයි එය සඳහන් කලේ ය.

ශ්‍රීලමබැසේස මාවිකුඹුරට හා පියරත්නට එරෙහි සිය අවලාද ඉල්ලා අස්කර ගත යුතු යැයි කියා සිටි

මබැසේස විධායක කමිටුව කම්කරුවන් වෙත පුලුල් ආයාචනයක් ද කලේ ය. "මබැසේස නායකයන්ට එල්ල කර ඇති තර්ජනය ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් සහ ජීවන කොන්දේසි ආරක්ෂා කිරීමට සටන් කරන සියලු දෙනාට ම අනතුරු ඇඟවීමකි. ප්‍රජාතන්ත්‍ර අයිතීන් රැක ගැනීමේ පුලුල් අරගලයක කොටසක් ලෙස මෙම තර්ජනයට එරෙහි උද්ඝෝෂනය ගත යුතු යැයි මබැසේස කියා සිටී. ප්‍රජාතන්ත්‍ර අයිතීන් අගයන සියලු සංවිධානවලින්, කම්කරුවන්ගෙන්, තරුනයන්ගෙන් හා බුද්ධිමතුන්ගෙන් ශ්‍රීලමබැසේස මබැසේස නායකයන්ට එල්ල කර ඇති මඩගැසීම් හෙලා දකිමින් ද ඒවා ඉවත් කර ගන්නා ලෙස ඉල්ලුම් කරමින් ද ප්‍රකාශන නිකුත් කරන ලෙස අපි ඉල්ලා සිටිමු." යැයි එය සඳහන් කලේ ය.

නොවැම්බර් 12 දා පැමින සිටි මබැසේස විධායක කමිටුවේ සාමාජිකයන් 12 දෙනාම යෝජනාවට පක්ෂව ඡන්දය දුන්හ. පැමින නොසිටි සාමාජිකයන් පස් දෙනාගෙන් තිදෙනෙක් ම එයට සිය සහයෝගය පල කිරිමට පසුව යෝජනාවට අත්සන් කලහ. සෙසු මහ බැංකු සේවකයෝ ශ්‍රීලමබැසේසයේ ප්‍රකෝපකාරී ක්‍රියාකලාපය හෙලා දැක්ක අතර වැඩ පොලේ පත්‍රිකාවක් ලෙස බෙදා හැර තිබූ සසප ප්‍රකාශය කෙරෙහි සිය සහයෝගය ද පල කර තිබේ.

එක් සේවකයෙක් *ලෝක සමාජවාදී වෙබ් අඩවියට* මෙසේ පැවසි යː "මම මේ ජවිපෙ පත්‍රිකාව දැක්ක ගමන් ම ඒකෙ තියෙන තර්ජනය ගැන මාවිකුඹුරට අනතුරු ඇඟෙව්වා. ජවිපෙ වෘත්තීය සමිති නායකයො කරල තියෙන්නෙ පොලිස්කාර වැඩක්. ඔවුන් තවත් පත්‍රිකාවක් නිකුත් කරල, පහුගිය වාර්ෂික මහා සභාවලට මාවිකුඹුරත් පියරත්නත් ඉදිරිපත් කරපු යෝජනාවලින් උපුටා දක්වල තියෙනව. ඒ යෝජනාවල තිබුනු උතුරෙන් හා නැගෙනහිරෙන් හමුදා ඉවත් කරන්න කියල කරපු ඉල්ලීම් සහිත කොටස් විතරයි ඔවුන් උපුටා දක්වල තියෙන්නෙ. ඒ යෝජනා කියවන ඕනෑම කෙනෙකුට තේරුම් ගන්න පුලුවන් ඒක සිංහල හා දෙමල කම්කරුවන් ඒකාබද්ධ කරන්න ගෙන යන උද්ඝෝෂනයක කොටසක් කියල.

"මහ බැංකුව පිහිටල තියෙන්නෙ අධි ආරක්ෂක කලාපයක. මාවිකුඹුරට හා පියරත්නට "සිංහල කොටි" කියල හංවඩු ගහන කොට ඒකෙ තර්ජනය දැවැන්තයි.

"අපි දන්නව මාවිකුඹුර මූලධර්ම වෙනුවෙන් සටන් වදින බව. මාස කීපයකට උඩදි මහ බැංකුවේ පාලකයන්ට නිර්නාමික පෙත්සමක් යවල තිබුන ජවිපෙ සමිතියේ සභාපති සරත් ඒකනායක එයාගෙ අතිකාල වෙලාවෙදි දේශපාලනය කරනවා කියල. ඒ පෙත්සමේ පිටපතක් මාවිකුඹුරටත් යවල තිබුන. ඔහු ඒකනායකට පෙත්සම පෙන්නල කිව්වා ඔහු මොන යම් හෝ දඩයමකට විරුද්ධයි කියල. ඔහු ඒක කමිටු සාමාජිකයන්ටත් කිව්වා.

"ජවිපෙ දැන් මිලිටරියට ප්‍රශංසා කරනව, මිලිටරියට මුලුමනින් ම සහයෝගය දෙනවා. 1988-89 කාලෙදි මිලිටරිය මේ සංවිධානය තලා දාල ඔවුන්ගෙ නායකයා වුනු රෝහන විජේවීර පවා මරා දැම්ම එකේ දැන් ඔවුන් මිලිටරියට සහයෝගය දෙන්නෙ ඇයි කියලා කෙනෙකුට පුදුම හිතෙන්න පුලුවන්. ඔවුන්ගෙ සහයෝගය පදනම් වෙන්නෙ සිංහල ස්වෝත්තමවාදය උඩ. ඔවුන් කම්කරුවන්ගෙ සංවිධානයක් බවට අඟවන්න උත්සාහ කලා වුනත් මේ සංවිධානයට කම්කරු පන්තිය ගැන කිසිම විශ්වාසයක් නැහැ."

තවත් මහ බැංකු සේවකයෙක් මාවිකුඹුරට හා පියරත්නට එරෙහි ශ්‍රීලමබැසේස ප්‍රකාශයට විරුද්ධ විය. "ඔවුන් (ජවිපෙ) යුද්ධයට මුලුමනින් ම සහයෝගය දෙනව, ඒ සඳහා උද්ඝෝෂනය කරනවා. ජවිපෙ යුද්ධයට එරෙහි ඉල්ලීම්වලට විරුද්ධ වෙන්නෙ එවන් ඉල්ලීම් ඔවුන්ගෙ අරමුනට විරුද්ධව යන නිසා.

"උතුරෙන් හා නැගෙනහිරෙන් ශ්‍රී ලංකා හමුදා ඉවත් කරන්න කියල කරන ඉල්ලීම ඉදිරිපත් කරන්නෙ සිංහල හා දෙමල ධනපති පන්තියට විරුද්ධව කම්කරුවන් ඒකාබද්ධ කරන්න කියන එකට මම එකඟ වෙනවා. මිලිටරිය හා පොලීසිය එහේ ඉන්න දෙමල ජනතාව මර්දනය කරනවා. ඔවුන් මෙහෙත් ඒ දේම කරනවා. මේ කම්කරුවො ඒකාබද්ධ කරන්නෙ නැතිව කිසිම දෙයක් කරන්න බැහැ. ජවිපෙ තමන් මාක්ස්වාදීන් බවට කියා ගන්නවා, ඒත් ඔවුන් මාක්ස්වාදීන් නොවෙයි."

මෙම සේවකයා වරක් ජවිපෙට සහයෝගය දී තිබුනත් ඔවුන්ගේ පිලිවෙත් කම්කරු පන්තියට සතුරු බව දැන් සලකයි. වැඩ පොල තුල දේශපාලනයට ශ්‍රීලමබැසේස දක්වන විරුද්ධත්වයට ද ඔහු සතුරු ය. "සමිති හා වැඩ පොල තුල "දේශපාලනය එපා" අපේ (ක්ෂනික) ගැටලු ගැන කතා කිරීම විතරක් සෑහෙයි යන අදහසට මම එකඟ වෙන්නෙ නැහැ. කම්කරුවො ජාත්‍යන්තර ප්‍රශ්න, රටේ ප්‍රශ්න ගැන, ආන්ඩුව ගැන කතා කරන්න ඕන."

ආන්ඩුව දේශපාලන අර්බුදයක ගිලී ඇති හෙයින් ආන්ඩුවට යුද්ධය අවශ්‍ය බව ඔහු පැහැදිලි කලේ ය. "ආන්ඩුව කම්කරුවන්ගෙ අයිතීන්ට පහර දෙනවා, මහජනතාවගෙ අවධානය (යුද්ධය යොදා ගෙන) ඉවතට යොමු කරන්න ආන්ඩුවට අවශ්‍යයි.

© www.wsws.org